සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

| 43 | S | II |
|---|---|---|

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

**Second Term Test - Grade 13 - 2020**

විභාග අංකය .............................

## ක්‍රිස්තියානි ධර්මය II

කාලය පැය තුනයි

වැදගත්

I කොටසින් ප්‍රශ්න දෙකක් ද II කොටසින් ප්‍රශ්න තුනක් ද තෝරා ගෙන ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.

## I කොටස

01. i. මිනිසාගේ පරිහරණය සඳහා ශුද්ධ බයිබලය මුලින් ම භාෂා අනුව පිටපත් කරන ලදී. එම පරිවර්තන ග්‍රන්ථ දෙකක් නම් කරන්න.
 ii. පුරාණ ගිවිසුමෙහි සම්මත ග්‍රන්ථ නාමාවලිය පිළිබඳ මතභේද දෙකක් ලියන්න.
 iii. නව ගිවිසුමෙහි අඩංගු ග්‍රන්ථ අතරින් ශුභාරංචි ග්‍රන්ථ, අපොස්තුළුවරුන්ගේ ක්‍රියාපොත, හා හසුන්පත් යන මේවා හි අඩංගු කරුණු පිළිබඳ අදහස් කෙටියෙන් වෙන වෙනම ලියන්න.
 iv. අදෘශ්‍යමාන දෙවියන් වහන්සේ, මැවිල්ලක් වන මිනිසාට අනාවරණය වෙයි. ඔබගේ ජීවිතය තුළ ස්වභාධර්මය මගින් මිනිසාට දේව අනාවරණය සිදු වූ අවස්ථා හතරක් ලියන්න.

02. i. මතෙව් සුභාරංචිය තුළ මතෙව් තුමා ඉදිරිපත් කරන දේශනා දෙකක් ලියන්න.
 ii. එතුමාගේ සෑම දේශනාවකම අවසානය පිළිබඳ පැහැදිලි ඉඟි දක්නට ලැබේ එවැනි ඉඟි මතෙව් සුවිශේෂයේ දැක්වෙන ආකාර හතරක් ලියන්න.
 iii. මතෙව්තුමා ඉදිරිපත් කරන යුගාන්තය පිළිබඳ දේශනයෙන් පෙන්වා දෙන අවසාන කාලයේ ස්වභාවය පිළිබඳ කියවෙන උපමා 06 ක් නම් කරන්න.
 iv. මනුෂ්‍යයා ගොදුරු වී සිටින සතර ආකාර වහල්කම් ලියා එයින් ගැලවීම ලබන්නට කිතුනුවන් කළ යුතු දේවල් හතරක් ලියන්න.

03. i. සභා ඉතිහාසය අධ්‍යයනය කරන ඔබට හතරවන සියවස තුළ කිතුණු සභාවේ දක්නට ලැබුණු වැදගත් කරුණු දෙකක් ලියන්න.
 ii. නවවන සියවස තුළ කිතුනු සභාවේ බටහිර අධිරාජ්‍යය කඩා වැටීමට බලපෑ කරුණු දෙකක් ලියන්න.
 iii. සභාවේ අධ්‍යාත්මික නිදහස බාහිර බලවේග වලින් රැකගැනීමට මුස්ලිම්වරුන්ට විරුද්ධව ගෙන ගිය කුරුස යුද්ධයේදී දක්නට ලැබූ ප්‍රතිඵල තුනක් ලියන්න.
 iv. රෙපරමාදු විප්ලවයේ ප්‍රතිඵලයක් ලෙස කතෝලික සභාව තුළ ප්‍රතිසංස්කරණයක් සිදුවිය එහිදී ක්‍රියා කළ පුරෝගාමී නිකායන් වූ වින්සෙන්තියානු නිකාය ආදර්ශයට ගෙන වර්තමාන සභාව තුළ ක්‍රියාවට නැංවිය යුතු ක්‍රියාමාර්ග හතරක් ලියන්න.

# II කොටස

04. i. දෙවියන් වහන්සේ තම සේවය සඳහා දුර්වලයන්, දුබලයන් තෝරා ගැනීමත් ඔවුන් ශක්තිමත් කරන ආකාරයත් බයිබල් කතුවරයා මෝසෙස් තුමාගේ කැඳවීම තුලින් ඉස්මතු කර පෙන්වා දෙන ආකාරය කරුණු පහක් ඔස්සේ පෙන්වා දෙන්න.

    ii. මෝසෙස්තුමාගේ කැඳවීම අනුව අභියෝගිකාර සමාජයක සේවය කලාක්මෙන් කිතුනු ඔබ ලබා ඇති කැඳවීම වර්තමාන සමාජය තුළ ක්‍රියාවට නඟන ආකාරය කරුණු පහක් ඔස්සේ පැහැදිලි කරන්න.

05. i. ජෙරමියා දිවැසිවරයා පිළිබඳ කෙටි හැඳින්වීමක් කර ජෙරමියා දිවැසිවරයා ඊශ්‍රායෙල් ජනතාවට දෙන දිවැසිවර පණිවිඩයට අනුව ඔබගේ ජීවිතය හැඩගස්වා ගන්නා ආකාරය කරුණු පහකින් පෙන්වා දෙන්න.

    ii. හොසියා දිවැසිවරයා තම විවාහ ජීවිතය නැමැති සංකල්පය තුළ දෙවියන් වහන්සේ හා සිය ජනතාව අතර ගිවිසුම් සබැඳියාව සංකේතවත් කරන ආකාරය කරුණු පහක් ඇසුරින් පහදන්න.

06. i. ශුද්ධ වූ පාවුළුතුමාගේ සංදේශ වල දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ පහක් සඳහන් කර, තිමෝතියස්ට ලියන ලද ප්‍රථම හසුනේ අරමුණු හා එහි අඩංගු විශේෂ කරුණු පෙන්වා දෙමින් පැහැදිලි කරන්න.

    ii. සැබෑ කිතුනුවකු ලෙස මිත්‍යා මත පිළිගැනීමෙන් ඉවත්ව ජීවත්වීමට ගත යුතු ක්‍රියාමාර්ග පහක් පෙන්වා දෙමින් පැහැදිලි කරන්න.

07. i. ප්‍රපාද ස්නාපනීය කැඳවීම තුළ කිතුනුවකු ලබන වරප්‍රසාදීය ජීවිතයේ ත්‍රිවිධ කාර්යය නම් කර ප්‍රසාද ස්නාපනයේදී ඔබ ලැබූ ත්‍රිවිධ කාර්යයන් හා වගකීම පාසල හා මීසම තුළ ක්‍රියාවට නංවන අයුරු කරුණු පහක් ඔස්සේ පෙන්වා දෙන්න.

    ii. සක්‍රමේන්තු ජීවිතයක් කරා ගමන් කරන කිතුනුවා දිව්‍ය සත් ප්‍රසාද භෝජනයෙන් පෝෂණය වී පරිත්‍යාගශීලී ජීවිතයක් ගත කිරීමට සූදානම් විය යුතුය. කිතුනුවකු වන ඔබ සූදානම් වන ආකාරය කරුණු පහක් ගෙන පැහැදිලි කරන්න.

08. i. ශ්‍රී ලංකාව තුළ කිතු දහමේ ඉතිහාසය පැවතෙන්නේ ක්‍රි.ව. 1505 දී පෘතුගීසීන් මෙරටට පැමිණීමත් සමඟය. එහෙත් මෙරට කිතුනු විශ්වාසයේ උරුමය ඊට සියවස් ගණනනාවකට පෙර සිට පැවත එන බව පෙන්වා දීම සාක්ෂි පහක් ඔස්සේ පැහැදිලි කරන්න.

    ii. පෘතුගීසි ධර්මදූතවරුන්ගේ ප්‍රයත්න සාර්ථක වීමට බලපෑ කරුණු පහක් ලියා, වර්තමාන කිතුනු සමාජය තුළ සාර්ථක ධර්මදූත සේවයක් කරා ගමන් කිරීමට ඔබ කරන යෝජනා පහක් පැහැදිලි කරන්න.